# යුද්ධයේ සමාජීය බලපෑම සහ සංවර්ධනය පිළිබඳ විමසුමක්

මධූෂා සඳරුවනි සමරකෝන්

මානව වර්ගයාට මුහුණදීමට සිදුව ඇති දුෂ්කරම සමාජ විද්‍යාත්මක හා සදාචාරාත්මක ගැටළුව "යුද්ධයයි". මෙහි ඇති සාහසික පදනම නිසා කිසිදු චින්තකයෙකු එය අනුමත නොකරනු ඇත. එය සැමවිටම යථාර්තමය ප්‍රපංචයක් වශයෙන් සමාජයේ පවතී. "යුද්ධ" සමාජයක් තුළ නිර්මාණය වීම සඳහා මානව සමාජයක පවතින විෂමතාවන් හා ගැටුම් හේතුවේ. ඒවා "සමාජ නිර්ණායක" මත ඇතිවූ විෂමතා හා ගැටුම් වේ. එනම් අයිතිවාසිකම්, වරප්‍රසාද, යනාදියේ විෂම ව්‍යාප්තිය හේතුවෙන් සමාජයක් තුළ ව්‍යුහීය වශයෙන් ඇතිවන ස්ථරගතභාවයයි.

ගැටුම් යන්න මානව ඉතිහාසයේ ආරම්භයේ සිටම විද්‍යමාන වන්නකි. ගැටුමක් යන්නෙන් ආරවුලක්, අර්බුදයක් හා ප්‍රචණ්ඩකාරී සටනක් යන අරුත් ගෙන දේ. ගැටුම් සමාජයේ සැම තරාතිරමකම මානව සම්බන්ධතා සමග බැඳී පවතින්නකි. එනම් පුද්ගලයන් දෙදෙනකු හෝ වැඩි දෙනකු අතර, පාර්ශවයන් දෙකක් හෝ කිහිපයක් සමග රාජ්‍යයන් දෙකක් හෝ කිහිපයක් අතර ගැටුම් නිර්මාණය වියහැකිය. ගැටුමක් යන්න නිර්වචනය කරගැනීමේදී මහාචාර්ය ජොහාන් ගැල්ටුංගේ (Johan Galtung) විසින් ඉදිරිපත් කරන ලද ගැටුම් පිළිබඳ ත්‍රිකෝණය ඉතා වැදගත් වේ.